# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1923/65 - 2015 ජූලි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2015.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක. 59.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12(2) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වගන්තිය යටතේ ක්‍රියාකරමින්, දේශීයව නිෂ්පාදනය කරනු ලබන සහ/හෝ ආනයනය කරනු ලබන පහත වර්ගීකරණයන් යටතට ගැනෙන වාහන භාවිතා කරන්නන් සඳහා වූ ආරක්ෂක හිස්වැසුම්, කිසිම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින්, වාහන භාවිතා කරන්නන් සඳහා වූ ආරක්ෂක හිස් වැසුම් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතියට (SLS 517) අනුව නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස එකී ආරක්ෂක හිස්වැසුම් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, බෙදාහැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

| | | |
|---|---|---|
| A වර්ගය | - | තරඟ ඉසව්වල භාවිතය සඳහා සහ විශේෂයෙන් ඉහළ මට්ටමක ආරක්ෂාවක් බලාපෙරොත්තු වන පළඳින්නන්ගේ භාවිතය සඳහා වන ආරක්ෂක හිස් වැසුම් |
| B වර්ගය | - | මංමාවත් මත සාමාන්‍ය යතුරුපැදි පදවන්නන් සඳහා වන ආරක්ෂක හිස් වැසුම් |

මෙම විධානය වර්ෂ 2016 සැප්තැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

ආචාර්ය ආර්. එම්. කේ. රත්නායක,
සභාපති.

2015 ජූලි මස 16 වැනි දින,
කොළඹ දී ය.

07 - 1499

1A - PG 2552 — 206 (2015/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*